Provincial Department of Education- Sabaragamuwawa

Sathi Pasala

Subject : JAPANESE LANGUAGE

Week: 01

Grade: Grade 12

Prepared by: K.O. Premathilake, Kuruwita Central Collage

**Unit 01** はつおん

## ජපන් භාෂා උච්චාරණය

**Aim** *ස්වර ශබ්ද සහ ව්‍යඤ්ජන ශබ්ද නිවැරදි ව උච්චාරණය කරමින් ජපන් භාෂාවේ හෝඩි පිළිබඳ ව මූලික දැනුමක් ලබා ගැනීම.*

ජපන් භාෂාවේ අක්ෂර වල මූලාශ්‍ර ඈත අතීතයේ දී චීනයේ සිට චීන භාෂාවෙන් පැවත ආ බව සඳහන් වේ. ජපන් භාෂාවේ ලිවීමේ ක්‍රම 3ක් වේ.

- හිරගනා (ひらがな)
- කතකනා (カタカナ)
- කන්ජි (かんじ)

හිරගනා ලෙස හැඳින්වෙන්නේ ජපන් භාෂාව ට ආවේණික වචන ලිවීමට භාවිතා කරන හෝඩිය ලෙස සරල ව හැඳින්විය හැක. මෙම හෝඩිය අක්ෂර 46 කින් සමන්විත වන අතර එක් අක්ෂරයකින් එක් ශබ්දයක් පමණක් උපදවයි.

උදා-:

- か = ක
- し = ෂි
- ね = නෙ

කතකනා යනු ජපානය ට ආගන්තුක එනම් විදේශීය භාෂා වලින් ජපන් භාෂාව ට පැමිණි වචන ලිවීමට භාවිතා කරන හෝඩිය ලෙස සරල ව හැඳින්විය හැක. මෙම හෝඩිය ද අක්ෂර 46 කින් සමන්විත වේ. එමෙන්ම කතකනා වල උච්චාරණය ඉංග්‍රීසි භාෂාවේ වචන වල උච්චාරණය ට බොහෝ දුරට සමාන වේ.

උදා -：

- Ice cream – アイスクリーム(aisu kurîmu)



- Bus – バス(basu)



- Cake – ケーキ( kêki)



කන්ජි යනු චීන භාෂාවෙන් ජපන් භාෂාව ට ලැබුණු රූපාක්ෂර විශේෂයක් වන අතර මේවා වසර දසදහස් ගණනකට පෙර චීනයෙන් ආරම්භ වූ බව ට ප්‍රචලිත ය. බොහෝ විට එක් කන්ජි අක්ෂරයකින් එක් වචනයක අර්ථයක් ප්‍රකාශ වේ. මෙවැනි කන්ජි 50,000ක් පමණ ඇති නමුත් සාමාන්‍යයෙන් ඉන් කන්ජි 4,000ක් පමණ භාවිතා කරයි



## හිරගනා හෝඩිය




හිරගනා හෝඩියේ ස්වර ( vowels) 5ක් වේ. සාමාන්‍යයෙන් ව්‍යඤ්ජනාක්ෂර ශබ්දයක් සහ ස්වර ශබ්දයක් එක් ව අක්ෂරයක් සෑදෙන බව සරල ව හැඳින්විය හැක. ( ක් + අ = ක). හිරගනා හෝඩිය ම පෙළ ගැස්වී ඇත්තේ මේ

ආකාරයටයි. එමෙන්ම මෙම ස්වර අක්ෂර උච්චාරණය කිරීමේ දී කට ඇර උච්චාරණය කළ යුතු වේ.

## හිරගනා හෝඩිය භාවිත කරන අවස්ථා

- නිපාත පද ලිවීමේ දී හිරගනා අක්ෂර භාවිත වේ.

  උදා - :

  これはせんせいのほんです

  私は がくせい です。

- විශේෂණ පද සහ ක්‍රියා පද වල අවසාන කොටස එනම් okurigana ලිවීමේ දී හිරගනා භාවිත වේ.

  උදා :-

  話します、食べます、寝ます、行きます

- කන්ජි රූපාක්ෂර කියවීමේ දී එයට ආධාරයක් වශයෙන් ඒවා උච්චාරණය කරන ආකාරය දැක්වීමට හිරගනා අක්ෂර යොදා ගැනේ. මේවා furigana ලෙස හැඳින්වේ.

  උදා-:

  食(た)べます、書(か)きます



## විශේෂ කරුණු

- හිරගනා හෝඩියේ ට, ඩ, ල අක්ෂර නැත. ඒවා වෙනුවට භාවිත කරන්නේ ත, ද, ර අක්ෂර වේ. (た、だ、ら)
- සි අක්ෂරය නැත. ඒ වෙනුවට භාවිත කරන්නේ ෂි අක්ෂරය යි. ( し)
- ති අක්ෂරය නැත. ඒ වෙනුවට භාවිත කරන්නේ චි අක්ෂරයයි. (ち)
- තු අක්ෂරය නැත. ඒ වෙනුවට භාවිතා කරන්නේ ත්සු අක්ෂරයයි. (つ)
- හු අක්ෂරය නැත. ඒ වෙනුවට භාවිත කරන්නේ ෆු අක්ෂරයයි. (ふ)
- අගට හල් අකුරු නැත ('න්' හැර)

ඔබ ගේ 日本語の文字 පෙළ පොතෙහි 03 වන පිටුව බලන්න.



Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

: SubjectJAPANESELANGUAGE

Week: 01

Grade: 12

Prepared by: K.O.Premathilake, Kuruwita central collage

# Unit 01　　日本のあいさつ

## ජපන් භාෂාවේ ආචාර විධි

**Aim** *ජපන් සංස්කෘතියේ ඇති ප්‍රධාන ලක්ෂණයක් වන ආචාර සමාචාර විධි වලදී භාවිතා වන යෙදුම් නිවැරදි අවස්ථා වලදී භාවිතා කිරීම සහ ඒවා ට පිළිතුරු දෙන ආකාරය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.*




අන්‍යයන් හට ගරු කිරීම හා සත්කාරය අතින් ලෝකයේ ප්‍රකට රටක් ලෙස ජපානය හැඳින්විය හැක. ජපන් බසින් ආචාර කිරීම් 'අයිසත්සු' (あいさつ) නමින් හැඳින් වේ. සියලු ආචාර කිරීම් ප්‍රකාශනයේදී අවසාන තුනටිය නවා සවන් දෙන්නා හට ඇති ගෞරවය හා පිලිගැනීම නිරූපනය කිරීම මෙහි ඇති සුවිශේෂී ලක්ෂණයකි.

මෙසේ තුනටිය නවා කරන්නා වූ ආචාරයද කලාවක් තරම් මෙන් පුළුල් පරාසයක විහිදී පවතී. එය නමින් 'සෙයිරිත්සු' (せいりつ) නම් වන අතර නැවෙනා විට සිරස් තලය සමග පිටකොන්ද, ආසන්නව සාදනු ලබන කෝණය හේතු කොට එහි ආකාර තුනකි.




එම ආකාර තුනම විවිධ අවස්ථාවල ( අචාර කරන පුද්ගලයා, එය ලබන්නා වූ පුද්ගලයා සහ කරනු ලබන ආචාර කිරිම කුමක් ද යන කරුණු අනුව ) ආචාර කිරීමට, සුදුසු පරිදි භාවිතා කරයි.

ඇතැම් ආචාර කිරීම් පොදුවේ තවත් භාෂාවකට හෝ වෙනත් රටක ආචාර කිරීම් හා සංසන්දනය කල නොහැක. එනම් ජපානයට ම අනන්‍ය වූ ආචාර විධි සමූහයක් ද පවතී. ඇතැම් ආචාර කිරීම් නිතරම, විවිධ අවස්ථාවල භාවිතා කිරීම දක්නට ලැබේ. ඒවායේ අර්ථය නිවැරදිව ම ප්‍රකාශ කල නොහැකි වන අතර භාවිතා කරන්නා වූ අවස්ථාවෙන් අවස්ථාවට අර්ථය වෙනස් වේ.




ජපන් භාෂාවේ භාවිතා වන ආචාර කිරීමේ විධි කිහිපයක් පහත සඳහන් පරිදි දැක්විය හැක.

01.**Hajimemashite** =පලමු වරට මුණ ගැසුණේ.
02.**Douzo yoroshiku** = හඳුනා ගන්නට ලැබීම සතුටක්.




03.**Ohayou gozaimasu** =Good morning (More polite)
04.**Konnichiwa** = Good afternoon / Hello/ hi
05.**Konbanwa** =Good evening
06.**Oyasuminasai** =Good night




07.**Sayounara** =Good bye
08.**Mata ashita** =See you tomorrow




09.**Arigatou** =Thank you (සම වයස් හෝ තමාට වඩා බාල අයෙකු ට මෙය භාවිතා කරයි.)

10.**Arigatou gozaimasu**= Thank you so much ( more polite)

11.**Iie, dou itashimashite** = You're welcome




12.**Sumimasen** =Excuse me /sorry (a polite word)




13.**Gomen nasai** =I am sorry (සම වයස් හෝ තමාට වඩා බාල අයෙකුට මෙය භාවිතා කරයි.)

14.**Gomen kudasai** =I'm sorry (තමා ට වඩා වයසින් වැඩි අය සඳහා මෙය භාවිතා කරයි. (මව, පියා, ගුරුවරුන් ආදී අය සඳහා))




15. **Itadakimasu** = Thankyou for the food (මෙය ජපන් ජාතිකයන් භාවිතා කරන විශේෂ යෙදුමක් වන අතර ආහාර ගැනීම ආරම්භ කිරීමට පෙර මෙලෙස ප්‍රකාශ කරයි.)




16. **Gochisousama deshita** = "What a well prepared dish.." (මෙය ආහාර අනුභවයෙන් පසු ව පවසන අතර ආහාර පිළිබඳ ව වර්ණනා කිරීම, ආහාර ලබා දුන්නාට ස්තූති කිරීම මෙමගින් සිදු කෙරේ.)




17.**Omedetou gozaimasu** = Congratulations (තමා ට වඩා වයසින් වැඩි අය සඳහා මෙය භාවිතා කරයි. (මව, පියා, ගුරුවරුන් ආදී අය සඳහා)

18.**Omedetou** = Congratulations (සම වයස් හෝ තමාට වඩා බාල අයෙකු ට මෙය භාවිතා කරයි.)

19.**Otanjoubi omedetou gozaimasu** = Happy Birthday




20. **Ganbatte kudasai** = Good luck! (තමා ට වඩා වයසින් වැඩි අය සඳහා ඔවුන් ව ධෛර්යමත් කිරීම සඳහා භාවිතා කරයි.)

21.**Ganbatte** = Good luck! (සම වයස් හෝ තමාට වඩා බාල අයෙකු ව ධෛර්යමත් කිරීම සඳහා භාවිතා කරයි)




22.**Itte kimasu** = I’m leaving.. (නිවසෙන් බැහැර වන විට මෙය භාවිතා කරන අතර ශ්‍රී ලාංකිකයන් නිවසෙන් බැහැර වන විට පවසන " ගිහින් එන්නම් " යන්න ට සමාන වේ)

23.**Itterashshai** = Please go and come back..( නිවසෙන් බැහැර වන පුද්ගලයා ගිහින් එන්නම් යැයි පැවසූ විට "ගිහින් එන්න" යැයි පැවසීමේදී මෙය භාවිතා කරයි.)




24. **Tadaima** = I’m back.. (නිවස ට නැවත පැමිණීමේදී මෙය භාවිතා කරයි.)

25. **Okaerinasai** = Welcome home..( නිවස ට පැමිණි අය පිළිගැනීමේදී මෙය භාවිතා කරයි.)




මෙලෙස ගත් විට ඇතැම් ආචාර කිරීම් පොදුවේ තවත් භාෂාවකට හෝ වෙනත් රටක ආචාර කිරීම් හා සංසන්දනය කල නොහැකි බව පැහැදිලි වනු ඇත . එමෙන්ම ජපානය ට ම අනන්‍ය වූ ආචාර විධි සමූහයක්ද ඇති බව පැහැදිලි වන අතර ඒවා භාවිතා කරන අවස්ථා වෙනස් වන ආකාරය ද විවිධ බව පැහැදිලි වේ. ඒවායේ අර්ථය නිවැරදිවම ප්‍රකාශ කල නොහැකි වන අතර භාවිතා කරන්නාවූ අවස්ථාවෙන් අවස්ථාවට අර්ථය වෙනස් වන බවත් පැහැදිලි වනු ඇත.

**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

: SubjectJAPANESELANGUAGE

Week: 01

Grade: 12

Prepared by: K.O.Premathilake, Kuruwita Central Collage

# Unit 01-01 ひらがな

## හිරගනා අකුරු ලියමු

***Aim*** *හිරගනා අක්ෂර නිවැරදි ව හඳුනා ගනිමින් අක්ෂර ලිවීමේ රීති වලට අනුකූලව ලිවීම සහ නිවැරදි ව කියවීම.*

හිරගනා ලෙස හැඳින්වෙන්නේ ජපන් භාෂාව ට ආවේණික වචන ලිවීමට භාවිතා කරන හෝඩිය ලෙස සරල ව හැඳින්විය හැක. මෙම හෝඩිය අක්ෂර 46 කින් සමන්විත වන අතර එක් අක්ෂරයකින් එක් ශබ්දයක් පමණක් උපදවයි. හිරගනා අක්ෂර ලිවීමේ දී එයටම ආවේණික රීති වලට අනුව ලිවිය යුතුමය. එම රීති මෙලෙස හැඳින්විය හැකිය.

- Stroke direction


හිරගනා අකුරු ලිවීමේ දී සැම විටම ඉහල සිට පහලටත් වමේ සිට දකුණටත් ලිවිය යුතු වේ.




## ❖ Three types of stroke ending

අතීතයේ ජපන් ජාතිකයන් අකුරු ලිවීමට භාවිතා කළේ පින්සලයි. එලෙස පින්සලෙන් ලිවීමේ දී අකුරු අවසන් කරන ක්‍රම 3ක් දක්වා ඇත.


1. Stop – とめ
2. Hook, brush up (はね)
3. Release (はらい)





පහත දැක්වෙන්නේ あ අක්ෂරයයි. එහි තැඹිලි පැහැයෙන් පෙන්වන්නේ ඉහත රීති අතරින් 1 වැන්නයි. එනම් とめ යන්නයි. එහි නිල් පැහැයෙන් පෙන්වන්නේ ඉහත රීති අතරින් 3 වන රීතියයි. එනම් はらい යන්නයි.



පහත දැක්වෙන්නේ い අක්ෂරයයි. එහි රතු පැහැයෙන් පෙන්වන්නේ ඉහත රීති අතරින් 2 වැන්නයි. එනම් はね යන්නයි.



හිරගනා අක්ෂර ලිවීමේ පහසුව සඳහා කොටස් 3 කට වෙන් කෙරේ.







දැන් අපි හිරගනා අකුරු ලියමු..




මෙමගින් අක්ෂර සියල්ල ම ලියන ආකාරය පිළිබඳව දළ අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.


එසේ නම් අපි あ、い、う、え、お ( අ,ඉ, උ, එ, ඔ )  ලියන ආකාරය බලමු.





Copyright © learn-japanese-adventure.com

අකුරු ලිවීමේ දී අංක කොට ඇති පිළිවෙලට ලිවීමට හුරු වන්න.

උදා:- あ ලිවීමේ දී මුලින්,




දෙවනුව,



අවසානයේ,


 ලෙසයි.

ඉන්පසු අපි か、き、く、 け、こ( ක, කි, කු, කෙ, කො ) ලියන ආකාරය බලමු.




Copyright © learn-japanese-adventure.com

さ、 し、す、せ、 そ (ස, ෂි, සු, සෙ, සො ) ලියන්නේ මේ ආකාරයටයි.



Copyright © learn-japanese-adventure.com

ඔබ ගේ 日本語の文字 පෙළ පොතෙහිපිටු අංක 05,06,07 හි ඇති අභ්‍යාස කරන්න.